සැ. යු. - 2012.03..23 දින පළ වූ අංක 1,751 දරන ගැසට් පත්‍රයේ I/III කොටස පළ නොවීය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,752 - 2012 මාර්තු මස 30 වැනි සිකුරාදා - 2012.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 808 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 816 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ජන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අප්‍රේල් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මාර්තු මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

මීගමුව මහ නගර සභාව

මීගමුව මහ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මීගමුව" යන ලිපිනයට 2012.04.30 වැනි දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | ගිනි නිවීම් සේවයේ මෝටර් යාන්ත්‍රික ගිනිභට | 04 | වැටුප් පරිමාණය - මාසික රු. 14,280- 145 x 7 -180 x 10 - 240 x 17 - 21,175 RS-1-2006A 5 වන පියවර ආරම්භක පියවර වේ. 3 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (සටහන 01 බලන්න) |
| 02. | ගිනි නිවීම් සේවයේ මූලික ගිනිභට තනතුර | 06 | වැටුප් පරිමාණය - මාසික රු. 15,850 - 180 x 7-240 x 02 -320 x 8 - 375 x 17 -26,525 -RS.-2-2006A 3 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (සටහන 02 බලන්න) |
| 03. | ගිනි නිවීම් සේවයේ අංශ භාර නිලධාරී තනතුර | 02 | වැටුප් පරිමාණය - මාසික රු. 15,850 - 180 x 7-240 x 02 -320 x 8 -375 x 17 26,525 RS-2-2006 A 5 වන පියවර ආරම්භක පියවර වේ. 3 වන පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (සටහන 03 බලන්න) |

**සටහන 01.**- (ගිනි නිවීම් සේවයේ මෝටර් යාන්ත්‍රික ගිනිභට තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්) :

(i) රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ රාජ්‍ය සංස්ථා සේවයේ තනතුර ස්ථිර කරනු ලැබූ ගිනිභටයකු ලෙස අවම වශයෙන් වසර 04 සේවා කාලයක් තිබිය යුතු ය. ;

(ii) බර වාහන පැදවීමේ බලපත්‍රයක් තිබිය යුතු ය. ;

(iii) බර වාහන පැදවීම පිළිබඳ අවම වශයෙන් අවුරුදු 02 ක පළපුරුද්දක් තිබිය යුතු ය. ;

(iv) බස්නාහිර පළාතේ අදාල පළාත් පාලන ආයතනය හෝ එම පළාත් පාලන ආයතනය විසින බලය පවරනු ලැබූ ආයතනයක් මගින් පවත්වනු ලබන තනතුරට අදාල වෘත්තීය පාඨමාලාවක් හදාරා සමත්වී තිබිය යුතු ය.;

(v) අයදුම්පත් කැඳවන දිනට පෙරාතුව බස්නාහිර පළාතේ යටත් පිරිසෙයින් වසර 03 ක් වත් ස්ථිර පදිංචියක් ඇති අයවළුන් විය යුතු ය.

***සටහන 02*** **:** ගිනි නිවීම් සේවයේ මූලික ගිනිභට තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා සේවයේ තනතුර ස්ථිර කරනු ලැබූ පළමුවන පන්තියේ ගිනිභටයකු ලෙස අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවා කාලයක් තිබිය යුතු ය ; හා

බස්නාහිර පළාතේ, අදාළ පළාත් පාලන ආයතනය හෝ එම පළාත් පාලන ආයතනය විසින් බලය පවරනු ලැබූ ආයතනයක් මගින් පවත්වනු ලබන තනතුරට අදාළ වෘත්තීය පාඨමාලාවක් හදාරා සමත් වී තිබිය යුතු ය ; හා

අයදුම්පත් කැඳවන දිනට පෙරාතුව බස්නාහිර පළාතේ, යටත් පිරිසෙයින් වසර 03 ක් වත් ස්ථිර පදිංචියක් ඇති අයවළුන් විය යුතු ය.

**සටහන 03 .**- ගිනි නිවීම් සේවයේ අංශභාර නිලධාරී තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

පළාත් රාජ්‍ය සේවයේ ගිනි නිවීම් කටයුතු පිළිබඳ අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතු ය. මින් අවුරුදු 03 කට නොඅඩු කාලසීමාවක් තනතුරෙහි ස්ථිර කරනු ලැබූ මූලික ගිනිභටයකු වශයෙන් සතුටුදායක සේවයක් තිබීම ; හා

බස්නාහිර පළාතේ අදාල පළාත් පාලන ආයතනය හෝ එම පළාත් පාලන ආයතනය විසින් බලය පවරනු ලැබූ ආයතනයක් මගින් පවත්වනු ලබන තනතුරට අදාළ වෘත්තීය පාඨමාලාවක් හදාරා සමත්වී තිබිය යුතු ය.

බාහිර අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන දිනට පෙරාතුව බස්නාහිර පළාතේ, යටත් පිරිසෙයින් වසර 03ක් වත් ස්ථිර පදිංචියක් ඇති අයවළුන් විය යුතු ය.

*සේවා කොන්දේසි හා නියමයන් .-*

*(අ)* මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

*(ආ)* ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කළින් කළ පනවනු ලබන වෙනත් කොන්දේසිවලට ද, අදාළ පළාත් පාලන ආයතනයේ ආයතන ප්‍රධානියාගේ නියෝගවලට ද, අනුකූලව ක්‍රියා කළ යුතු ය. මෙම තනතුරෙහි සේවය බස්නාහිර පළාත තුළට සීමා වේ.

*(ඇ)* තෝරා ගනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළදී වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක වේනම් පරිවාස කාලය අවසානයේදී සේවය ස්ථිර කරනු ලබයි. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර 01 වැඩ බැලීමේ කාලයකට යටත් කර බඳවා ගනු ලැබේ.

*වයස .-*

*ගිනි නිවීම් සේවයේ මෝටර් යාන්ත්‍රික ගිනිභට තනතුර හා ගිනි නිවීම් සේවයේ මූලික ගිනිභට තනතුර සඳහා :-*

01. අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

*ගිනි නිවීම් සේවයේ අංශභාර නිලධාරි තනතුර සඳහා -*

01. අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 25 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

*වෙනත් පොදු කොන්දේසි .-*

01. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතු ය. ;
02. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ. ;
03. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවකු නොවිය යුතු ය. ;
04. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුය. ;
05. සෑම නිලධාරියෙකුම තනතුරට පත්වී වසර 05 තුළ තනතුරට නියමිත දෙවෙනි රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබාගත යුතු ය. ;

*බඳවා ගැනීමේ ක්‍රමය .-*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 ප්‍රකාරව ලිඛිත වෘත්තීය පරීක්ෂණයක් පවත්වා එහි කුසලතාවය මත තෝරාගන්නා අයවළුන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවාගැනීම සිදුකෙරේ.

*ලිඛිත පරීක්ෂණ සඳහා.-*

1. ගිනි නිවීම් සේවයේ මෝටර් යාන්ත්‍රික ගිනිභට තනතුර සඳහා පැය 01 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතු ය.
   - (i) විද්‍යාව
   - (ii) තාක්ෂණය.

2. ගිනි නිවීම් සේවයේ මූලික ගිනිභට තනතුර සඳහා පැය 01 1/2 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතුය.

(i) විද්‍යාව,
(ii) තාක්ෂණය,
(iii) අන්තරාදායක ද්‍රව්‍ය,
(iv) විධානය හා නායකත්වය.

3. ගිනි නිවීම් සේවයේ අංශභාර නිලධාරි තනතුර සඳහා ;

(i) විද්‍යාව,
(ii) තාක්ෂණය,
(iii) අනතරාදායක ද්‍රව්‍ය,
(iv) විධානය හා නායකත්වය,
(v) ස්ථාන පාලනය හා කළමනාකරණය.

නාගරික කොමසාරිස්,
මීගමුව.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*මීගමුව මහ නගර සභාව*

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

........................................................ *තනතුර සඳහා අයදුම් පත්‍රය*

1. මුලකුරු සමග නම : ——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් : ——————————.
3. දැනට සේවය කරන ආයතනය හා තනතුර : ——————————.
4. සේවා කාලය (තනතුරට අදාලව වෙන් වෙන් වශයෙන්) : ——————————.
5. ජාතික හැඳුනුම්පත් අංකය : ——————————.
6. ස්ථිර පදිංචි ලිපිනය: ——————————.
7. තැපැල් ලිපිනය: ——————————.
8. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය: ——————————.
9. පදිංචිය පිළිබඳ විස්තර: ——————————. සිට —————— දක්වා.
10. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ——————————.
11. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය: ——————————.
12. උපන් දිනය: ——————————.
13. 2012.04.30 දිනට වයස: ——————————.
14. අධ්‍යාපන සුදුසුකම්: ——————————.
15. බර වාහන පැදවීමේ බලපත්‍රයේ විස්තර: ——————————.
16. පළපුරුද්ද: ——————————.
17. තනතුරට අදාල වෘත්තීය පාඨමාලා පිළිබඳ විස්තර: ——————————.
18. වෙනත් සුදුසුකම්: ——————————.
19. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කර තිබේ ද යන වග: ——————————.
20. බස්නාහිර පළාත තුළ පසුගිය වසර 03ක පදිංචිය පිළිබඳ විස්තර: ——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සකු කිරීමටත් බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහකිරීමටත් යටත්වන බව හොඳාකාරවම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන

දිනය : ——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන........................................................ මහතා./මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ............................................. වශයෙන් සේවය කරයි. මෙම තනතුරු සඳහා ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

——————————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

නම : ——————————.
තනතුර : ——————————.
දිනය : ——————————.

03-1008/1

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### මීගමුව මහ නගර සභාව

මීගමුව මහ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මීගමුව" යන ලිපිනයට 2012.04.30 දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. :-

දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | වෙළඳසැල් පරිපාලක II ශ්‍රේණිය | 01 | MN1-2006A ආරම්භක වැටුප් පියවර රු. 13,120 4 වැනි පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි | (සටහන 01 බලන්න) |

*සටහන 01* :- වෙළඳසැල් පරිපාලක තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් :-

(*අ*) දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 04කට සම්මාන සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 06කින් සමත්ව තිබිය යුතුය.

සහ

(*ආ*) මනා පෞරුෂයකින් යුක්ත විය යුතු අතර සිංහල හා දෙමළ භාෂාවලින් කථා කිරීමට හැකියාව තිබිය යුතුය.

*සේවා කොන්දේසි හා නියමයන් :-*

(*අ*) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(*ආ*) වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(*ඇ*) තෝරාගනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළ දී වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක වේනම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලබයි. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර 01 ක වැඩ බැලීමේ කාලයකට යටත්කර බඳවාගනු ලැබේ.

*වෙනත් පොදු කොන්දේසි :-*

01. අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
02. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.
03. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
04. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
05. අයදුම්පත් කැඳවන දින වන විට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් තිබිය යුතුය.
06. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය*.- වෙළෙඳසැල් පරිපාලක තනතුරුවලට බඳවාගනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 ප්‍රකාර ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත වේ. ලිඛිත පරීක්ෂණය සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක් හා සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන පැය 01ක ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
මීගමුව.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*මීගමුව මහ නගර සභාව*

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

........................................................ *තනතුර සඳහා අයදුම් පත්‍රය*

1. මුලකුරු සමග නම : ——————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් : ——————————.
3. ජාතික හැඳුනුම්පත් අංකය : ——————————.
4. ස්ථිර පදිංචි ලිපිනය: ——————————.
5. තැපැල් ලිපිනය: ——————————.
6. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය: ——————————.
7. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ——————————.
8. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය: ——————————.
9. උපන් දිනය: ——————————.
10. 2012.04.30 දිනට වයස: ——————————.
11. අධ්‍යාපන සුදුසුකම්: ——————————.
12. පළපුරුද්ද: ——————————.
13. වෘත්තීය සුදුසුකම් : ——————————.
14. වෙනත් සුදුසුකම්: ——————————.
15. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කර තිබේ ද යන වග: ——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සකු කිරීමටත් බඳවාගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහකිරීමටත් යටත්වන බව හොඳාකාරවම දනිමි.

——————————.

අයදුම්කරුගේ අත්සන

දිනය : ——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන.............................................................. මහතා/මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ........................................... වශයෙන් සේවය කරමි. මෙම තනතුරු සඳහා ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

——————————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ——————————.

තනතුර : ——————————.

දිනය : ——————————.

03-1008/2

## කටුනායක - සීදූව නගර සභාව

බස්නාහිර පළාතේ පළාත් රාජ්‍ය සේවයේ කටුනායක-සීදූව නගර සභාවේ පුරප්පාඩු වී ඇති කාර්යාල සේවක සේවය III පංතියේ සෞඛ්‍ය කම්කරු තනතුරු 08ක් සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රය ප්‍රකාර සකස් කරගත් ඉල්ලුම්පත්‍ර "ලේකම්, කටුනායක සීදූව නගර සභාව, සීදූව" යන ලිපිනයට 2012.04.30 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ " සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් කර එවිය යුතුය. අසම්පූර්ණ ඉල්ලුම්පත් මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. *අධ්‍යාපන සුදුසුකම්.-* අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ.

04. *වයස් සීමාව.-* ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

05. *පොදු සුදුසුකම් :-*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතුය.
(ii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
(iii) අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 3ක අවම කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුය.
(v) මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

06. *බඳවා ගැනීමේ ක්‍රමය.-* සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/95 අනුව සිදුකරනු ලබන විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මත බඳවා ගැනේ.

07. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. නව බඳවා ගැනීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.
(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006(iv)හි පීඑල් 1-2006-ඒ පරිදි රු. 11,730-10x120-10x130- 10x145 - 12x160 - රු. 17,600 පරිමාණයේ ආරම්භක වැටුප් පියවර වන රු. 11,730ක් වූ වැටුප් පියවරේ පිහිටුවනු ලබන අතර 04 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.
(iii) වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
(iv) තෝරාගනු ලබන්නන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුලදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේදී සේවය ස්ථිර කරනු ලබයි. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර එකක වැඩ බැලීමේ කාලයකට යටත්කර බඳවා ගනු ලැබේ.

08. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය :-

(i) උප්පැන්න සහතිකය,
(ii) පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය.

එම්. ඩී. එස්. ප්‍රසාදිනී,
ලේකම්,
කටුනායක - සීදූව නගර සභාව.

2012 මාර්තු මස 12 වැනි දින.

## කටුනායක - සීදූව නගර සභාව

***සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා අයදුම් පත්‍රය***

01. (අ) මුලකුරු සමග නම :————.
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
03. (අ) ස්ථිර පදිංචි ලිපිනය :————.
දුරකථන අංකය :————.
(ආ) කාර්යාලීය ලිපිනය :————.

දුරකථන අංකය :————.

04 . (i) උපන් දිනය :————.

(ii) 2010 දිනට වයස :————.

අවුරුදු :————, මාස :————, දින :————.

04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

05. විවාහක/අවිවාහක බව :————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

07. අධ්‍යාපන සුදුසුකම් :————.

08. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :————.

09. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේද ? එසේ නම් එම විස්තර :

ම විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළිවුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන*

මෙම ආයතනයේ ......................... තනතුර දරන ......................... මයා./මිය./මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහුගේ/අයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/නොහැක.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.

---

03-1058

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### මහර ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මහර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා බස්නාහිර පළාත තුල පදිංචි සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසිකව)* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | කාර්යාල සේවක සේවය II (පුස්තකාල සහයක) | 01 | රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600 (PL I-2006A) 12 වන පියවර ආරම්භක පියවර වේ. | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක්වරකදී, කවර හෝ විෂයයන් 06ක් සමත් විය යුතු වේ. |
| 02. | කාර්යාල සේවක සේවය III (මාර්ග කම්කරු) | 01 | රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600 (PL I-2006A) | 06 ශ්‍රේණිය සමත් විය යුතු වේ. |
| 03. | කාර්යාල සේවක සේවය III (සෞඛ්‍ය කම්කරු) | 01 | රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600 (PL I-2006A) | අධ්‍යාපන සුදුසුකම් අවශ්‍ය නැත. |

*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(1) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය;
(2) අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්නයේ වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය;
(3) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩ බල නොපානු ඇත.) ;
(4) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතුය;
(5) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවකු හෝ රජයේ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුය;
(6) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මහර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

(1) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(2) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(3) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
(4) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලටද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ මහර ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය:*

(1) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.
(2) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කල යුතුය.

*අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කල පිටපත් එවිය යුතුයි.*

(1) උප්පැන්න සහතිකය
(2) අධ්‍යාපන සහතිකය
(3) මෑතකදී ලබාගත් ග්‍රාම සේවා සහතිකය
(4) මෑතකදී ලබාගත් චරිත සහතික 2 ක්.
(5) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික
(6) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

*අයදුම්පත් ඉදිරිපත් කිරීම*

මෙම නිවේදනයේ පරිදි 12" x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස්කර ඉල්ලුම්කරන තනතුර අදාල කවරයේ වම්පස ලියා 2012.04.30 දිනට පෙර ලේකම්, මහර ප්‍රාදේශීය සභාව, පහළකරගහමුණ, කඩවත යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දිනෙන් පසු ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්. ඒ. කේ. එන්. ඉන්ද්‍රජිත්,
ලේකම්,
මහර ප්‍රාදේශීය සභාව.

2012 මාර්තු මස 14 වැනි දින,
කඩවත,
පහළ කරගහමුණ,
මහර ප්‍රාදේශීය සභාවේ දී ය.

03-1160

# පළාත් පාලන නිවේදන

## වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර බස්නාහිර පළාත් සභාවේ කළුතර දිස්ත්‍රික්කයේ වලල්ලාවිට ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයෙන් දක්වා ඇති මංමාවත් වලල්ලාවිට ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම මංමාවත් සම්බන්ධයෙන් යම් විරුද්ධත්වයක් පලකරනු ලබන්නේ නම් මෙම නිවේදනයේ දින සිට එක් මසක් ඇතුලත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියාකරන ලෙස මෙයින් දන්වා සිටිමි.

මෙම කාල සීමාව තුළ විධි වූ පරිදි යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ දක්වා ඇති පරිදි සභාව සතු මාර්ග වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

උදේනි අතුකෝරළ,<br>
සභාපති,<br>
වලල්ලාවිට ප්‍රාදේශීය සභාව,<br>
මීගහතැන්න.

2012 මාර්තු මස 12 වැනි දින,

| අනු. අංකය | මාර්ගයේ නම | දිග | පළල | ආරම්භය | අවසානය |
|---|---|---|---|---|---|
| 01. | ගුලනවත්ත නාවල මණ්ඩගල පාර | 2.5 | 6.09 | නෙළුව පාර, 06 කණුව | පැලවත්ත බඳුරලිය පාර |
| 02. | වීරකන්ද පාර | 3.00 | 6.09 | නෙළුව පාර, 05 කණුව | දාබඩ කන්ද |
| 03. | පොල්ගස් යාය පාර | 1.50 | 4.78 | වීරකන්ද පාරේ බී. පී. අබේරත්න මයාගේ නිවස | ඩබ්. ඒ. චන්ද්‍රසිරි මයාගේ නිවස |
| 04. | අක්කර 50 පාර | 3.50 | 4.78 | පහල හෙවෙස්ස රාජ්‍ය වතුයාය පාර | අක්කර 50 ගම්මානය |

03-1108

---

## අගලවත්ත ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා මහජන පුස්තකාල සඳහා වූ අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනත සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් 2005.02.18 වැනි දින අංක 1381 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(අ) කොටස මගින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රාදේශීය සභාවන්හි මහජන පුස්තකාල සඳහා වූ අතුරු ව්‍යවස්ථාව බස්නාහිර පළාත් සභා පරිපාලන ප්‍රදේශයට අයත් අගලවත්ත ප්‍රාදේශීය සභාව විසින් 2005.03.31 වැනි දින යෝජනා අංක 08 :.02 යටතේ පිළිගෙන වැළඳගැනීමට තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර් ඒ. ඩී. කේ. චාමින්ද රණවක,<br>
සභාපති,<br>
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2012 පෙබරවාරි මස 28 වැනි දින,<br>
අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දී ය.

03-1031

## කුරුණෑගල මහ නගර සභාව

2012 වර්ෂය සඳහා දේපළ බද්ද

මහ නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තිය යටතේ (252 අධිකාරය) හා එම වගන්තියේ සඳහන් සීමාවන්ට සහ නිදහස් කිරීම්වලට යටත්ව කුරුණෑගල මහ නගර සභාවේ පාලන සීමාව තුල තිබෙන සියලුම ඉඩම්, ගොඩනැගිලි හා වාසස්ථානවල වාර්ෂික වටිනාකම්වලින් 2012 කාර්තු හතර සඳහා 7%ක බද්දක් පැනවීමට කර තිබූ තීරණය පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇති බව කාරුණිකව දැනුම් දෙනු ලැබේ.

පළමු කාර්තුව 7%, 2, 3, 4 කාර්තු 4% බැගින්. මෙම බද්ද පිළිවෙලින්, 2012 වර්ෂයේ 2, 3, 4 කාර්තු සඳහා ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 දින හෝ ඊට ප්‍රථම ගෙවිය යුතු වේ.

තවද 1979 අංක 42 දරන මහ නගර සභා (සංශෝධන) පනතින් මහ නගර සභා ආඥාපනතේ 230 හා 255 වගන්තිවලට කරන ලද සංශෝධනයන් අනුව 2012 වර්ෂයේ 2, 3, 4 කාර්තු සඳහා සෑම කාර්තුවක් වෙනුවෙන්ම, ගෙවිය යුතු මුලු වරිපනම් බද්ද අදාළ කාර්තුවේ මුල් මාසය තුළදී ගෙවන්නේ නම් එම කාර්තුවේ වරිපනම් බද්දෙන් සියයට පහක (5%) වට්ටමක් අඩුකරනු ලබන අතර නියමිත දිනවලට පසුව ගෙවනු ලබන වරිපනම් බදු සඳහා පහත සඳහන් අන්දමට වරෙන්තු ගාස්තු අය කරනු ලබන බව ද වැඩිදුරටත් දැනුම් දෙනු ලැබේ.

| | |
|---|---|
| නිවාස ස්ථානවලින් හා මුඩු ඉඩම්වලින් | 15% |
| මුඩු ඉඩම් හා නිවාස නොවන අනෙකුත් සෑම ස්ථානයකින්ම | 20% |
| සංවර්ධනය නොකළ ඉඩම් වලින් | 20% |

ඔබ විසින් මේ වනවිටත් කාර්තු හතර සඳහාම 7% ප්‍රතිශතය මත වරිපනම් බදු ගෙවා ඇත්නම් වැඩිපුර මුදල 2013 වර්ෂයට හිලව් කරනු ලැබේ.

ජී. කේ. එස්. චන්ද්‍රලතා,
නාගරික කොමසාරිස්,
කුරුණෑගල මහ නගර සභාව.

2012 මාර්තු මස 09 වැනි දින.

03-984

---

## කැලණිය ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය අනුව කරන දැනුම්දීමයි

ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය ප්‍රාදේශීය සභාව 2012.01.30 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී සම්මත කරන ලද, යෝජනාව අනුව, කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, පිහිටි පහත සඳහන් අතුරු මං මාවත භාවිතා කරන ඉඩම් හිමියන් විසින් සභාව වෙත ලබා දී ඇති, ලිඛිත කැමැත්ත අනුව, එම මාවත සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ. ප්‍රදේශවාසී ජනතාව විසින් මෙම අතුරු පාර සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට විරුද්ධවන්නේ නම්, ඒ කුමන කරුණක් නිසාද යන්න සඳහන් කළ ලියවිල්ලක්, පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වන දින සිට, දින 30ක් ඇතුළත මා වෙත එවීමට කටයුතු කළ යුතු බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවක් ඉදිරිපත් නොවුවහොත් ඉන් පසු එම පාර ප්‍රාදේශීය සභාව සතු මාවතක් ලෙස සලකා ඉදිරියේදී පාලනය කරනු ලබන බවටත්, මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

බී. ප්‍රසන්න රණවීර,
සභාපති,
කැලණිය ප්‍රාදේශීය සභාව.

*පාරේ විස්තරය*

| | | |
|---|---|---|
| ග්‍රාම නිලධාරි වසම | : | 260/ඒ, දළුගම |
| පාරේ නම | : | දිප්පිටිගොඩ පළවන හරස් පාරේ (ගනේගොඩ වත්ත) අතුරු පාර |
| පාරේ ආරම්භය | : | දිප්පිටිගොඩ පළමු හරස් පාර |
| පාරේ අවසානය | : | තැපැල් අංක 66/4/ඒ, පියල් හේවා පතිරණ මහතාට අයත් දේපළ |
| පාරේ දිග | : | මීටර් 87.8 |
| පාරේ පළල | : | මීටර් 4.3 හා මීටර් 3.5 |

(මෙම පාරට අදාළව කේ. එස්. ජයසේකර මිනින්දෝරු මහතා විසින් 2012.02.21 වන දින අඳින ලද අංක 206 දරන මානක සැලැස්ම ද, සභාව සතුව පවතියි.)

| | | |
|---|---|---|
| උතුරට | : | අංක - පියල් හේවාපතිරණ මහතා හිමිකම් කියන අංක 66/4/ඒ දරන ඉඩම. |
| නැගෙනහිරට | : | නිමල් සරත්චන්ද්‍රගේ මහතා හිමිකම් කියන අංක 60/2 දරන ඉඩම, රියෙන්සි පතිරණ මහතා හිමිකම් කියන අංක 66/6 දරන ඉඩම, ටී. පී. විජේරත්න මහතා හිමිකම් කියන අංක 66/බී දරන ඉඩම. |
| දකුණට | : | පළවන හරස් පාර (දිප්පිටිගොඩ සිට නිවාසවලට යන පාර). |
| බස්නාහිරට | : | තාරක මනෝජ් ඩයස් මහතාගේ ඉඩම හා ටී. විජයරත්නගේ මහතා හිමිකම් කියන අංක 68 දරන ඉඩම. |

03-985

---

## වැලිගම නගර සභාව

### නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය වන) 55 "අ" වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කරනු ලබන නිවේදනය

වැලිගම නගර සභා බල ප්‍රදේශයට අයත් වැලිගම, අලුත්වීදිය, අරුෂියා මාවත පටුමග කොන්ක්‍රීට් කරන ලද පාර "මරුහුම් ඒ. සී. එම්. පලීල් මාවත" නමින් නම් කරනු ලබන බව මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මොහොමඩ් හුසෙයින් හාජියාර් මුහම්මද්,
සභාපති,
වැලිගම නගර සභාව.

2012 මාර්තු මස 01 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

03-1110

## වැලිගම නගර සභාව

### නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය වන) 55 "අ" වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කරනු ලබන නිවේදනය

වැලිගම නගර සභා බල ප්‍රදේශයට අයත් වැලිගම, වල්ලිවල, මහනැවියා පාරේ කොන්ක්‍රීට් කරන ලද අතුරු මාර්ගය වන වැලිකනත්ත පාර "තල්අරඹේ පියරතන නාහිමි මාවත" නමින් නම් කරනු ලබන බව මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මොහොමඩ් හුසෙයින් හාජියාර් මුහම්මද්,
සභාපති,
වැලිගම නගර සභාව.

2012 මාර්තු මස 01 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

03-1109

## කුරුණෑගල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්ති යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතෙහි 1 වැනි පරිච්ඡේදයේ 4 වගන්ති ප්‍රකාර වයඹ පළාත් සභාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති පොදු සුසාන භූමි කුරුණෑගල ප්‍රාදේශීය සභාව සතු පොදු සුසාන භූමි ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම සුසාන භූමි සම්බන්ධයෙන් අදාල ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශ්වයක් විසින් යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම් මේ නිවේදනයේ සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

දේශබන්ධු පැට්‍රික් කරුණාසිංහ,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2012 මාර්තු මස 12 වැනි දින,
බෝයගනේ මල්පිටිය,
කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දී ය.

### උපලේඛනය

| | සුසාන භූමියේ නම | පිහිටීම | පිඹුරුපත් අංකය සහ දිනය | ඉඩමේ ප්‍රමාණය | මායිම |
|---|---|---|---|---|---|
| 1. | මරළුවාව බාබර්වත්ත පොදු සුසාන භූමිය | මරළුවාව | 2014/2007.09.04 | අ.0 රූ.03. පර්.1 | උතුරට : ඩී. එස්. ද සිල්වා සහ අනිත් අය හිමිකම් කියන බාබර්වත්ත<br>දකුණට : මු.පි.කු/1638 කැබලි අංක 02<br>නැගෙනහිරට : දුම්රිය මාර්ගය හා රක්ෂිතය මු. පි. 2269<br>බටහිරට : මු. පි. කු/1638 කැබලි අංක 12/2 |
| 2. | බෝහිටියවත්ත පොදු සුසාන භූමිය | නයිලිය | 86/2008/2008.03.18 | අ.0 රූ.02 ප. 7.6 | උතුරට : ගම මැද පාර<br>දකුණට : ආර්. පී. ජයවර්ධනගේ ඉඩම<br>නැගෙනහිරට : එන්. පී. ජයන්ත ගුණවර්ධනගේ ඉඩම<br>බටහිරට : ජේ. පී. චන්ද්‍රසේකරගේ ඉඩම |
| 3. | උඩදිගන පොදු සුසාන භූමිය | උඩදිගන | 194/2009.09.17 | අ. 0 රූ.02 ප. 8.48 | උතුරට : එම්. ජී. සෝමාවතීගේ ඉඩම<br>දකුණට : එන්. ගුණරත්න හා එස්. එම්. නිමල් කරුණාතිලක හිමිකම් කියන කුඹුර<br>නැගෙනහිරට : චන්ද්‍රා හේරත් හිමිකම් කියන ඉඩම<br>බටහිරට : එන්. ගුණවර්ධන හිමිකම් කියන ඉඩම |
| 4. | අත්තනපිටිය පොදු සුසාන භූමිය | අත්තනපිටිය | 145/2010/2010.08.17 | අ. 0 රූ. 01 පර්. 16.1 | උතුරට : එස්. සෝමපාල හිමිකම් කියන ඉඩම<br>දකුණට : ජී. සිරිල් රත්නායක සහ තවත් අය හිමිකම් කියන ඉඩම<br>නැගෙනහිරට : තෙන්නකෝන් උඩගෙදර සහ තවත් අයට අයිති ඉඩම<br>බටහිරට : එස්. සිරිසේන සහ තවත් අය හිමිකම් කියන පවුලේ සුසාන භූමිය |

03-1098

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.